# මෝටර් රථ රක්ෂණාවරණයක් ලබා ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු

IBSL
INSURANCE BOARD OF SRI LANKA

## නියම වටිනාකමට රක්ෂණය කරන්න

වාහනයේ වෙළඳපොළ වටිනාකමට රක්ෂණාවරණය ලබාගන්න. අඩු වටිනාකමකට රක්ෂණය කළහොත් වන්දි අඩුවෙන් ලැබීමටත්, වැඩි වටිනාකමකට රක්ෂණය කළ ද වෙළඳපොළ වටිනාකමට පමණක් වන්දි ලැබීමටත් ඉඩ ඇත.





## රක්ෂණ ඔප්පුව කියවා තේරුම් ගන්න

රක්ෂණ ඔප්පුව තමන්ට තේරෙන භාෂාවෙන් රක්ෂණ සමාගමෙන් ඉල්ලාගන්න. එහි කොන්දේසි හා ආවරණ පිළිබඳව දැනුවත් වන්න. වාහනය කුලියට හෝ බද්දට දෙන්නේ නම්, එය ආවරණය වන පරිදි සුදුසු රක්ෂණය ලබාගන්න.

## වාරික ගෙවීමේ බැඳුම්කරය

රක්ෂණ වාරිකය යම් කාලසීමාවක් (සාමාන්‍යයෙන් දින 60 ක්) ඇතුළත ගෙවීමට ඔබ එකඟවී ඇත්නම්, එම කාලය ඉකුත්වීමට පෙර වාරිකය ගෙවන්න. නැතහොත් රක්ෂණ ඔප්පුව අවලංගු වන අතර ඒ යටතේ කිසිදු හිමිකම්පෑමක් කළ නොහැක.





## රක්ෂණීය අයිතිය

වාහනයක රක්ෂණීය අයිතිය ඇත්තේ එහි වත්මන් අයිතිකරු වෙතයි. ඔබ මිලදී ගන්නා වාහනය සඳහා නොපමාව ඔබගේ නමින් රක්ෂණාවරණයක් ලබාගන්න. නොඑසේනම් අනතුරකදී වාහනයේ පෙර අයිතිකරුගේ නමින් ඇති රක්ෂණාවරණය යටතේ හිමිකම් ලබාගැනීමට ඔබට හැකියාවක් නැත.

## රක්ෂණ සමාගමක් තෝරා ගැනීමේ අයිතිය

රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වූ ඕනෑම රක්ෂණ සමාගමකින් ඔබට අවශ්‍ය රක්ෂණාවරණය ලබාගත හැක. යම් නිශ්චිත රක්ෂණ සමාගමකින් රක්ෂණාවරණයක් ලබා ගන්නා ලෙස කිසිවකුටත් ඔබට බල කළ නොහැක.





## අනතුරක් වූ වහාම දැනුම් දෙන්න

වාහනය අනතුරකට ලක් වූ වහාම, ඒ පිළිබඳව අදාල රක්ෂණ සමාගමට දැනුම් දී හිමිකම් ලබාගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර පිළිබඳ උපදෙස් ලබාගන්න. අනතුර පිළිබඳව ලඟම ඇති පොලිස් ස්ථානයට දැනුම්දීම මෝටර් වාහන පනත යටතේ අනිවාර්යය කොට ඇත.


**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය,** 11 වන මහල, නැගෙනහිර කුළුණ ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථනය : 011 2396184-9 ෆැක්ස් : 011 2396190-1
ඊ-මේල් : info@ibsl.gov.lk වෙබ් අඩවිය : www.ibsl.gov.lk